රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

**2024-05-22 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව සඳහා වන ජපාන ආධාර වැඩසටහන - 2024**

ජපාන රජය විසින් මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව සඳහා වන ජපාන ආධාර වැඩසටහන යටතේ ශාස්ත්‍රපති උපාධි සහ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා මෙරට රාජ්‍ය අංශයේ විධායක මට්ටමේ නිලධාරින්ට අවස්ථාව සලසා දෙනු ලබයි. 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එම වැඩසටහන යටතේ කාර්යරාමු 3ක් අවසන් කර ඇති අතර, 2022 වර්ෂයේදී ආරම්භ කරන ලද එහි 4 වන කාර්යරාමුව 2025 වසරේදී අවසන් වීමට නියමිතව ඇත. එම වැඩසටහන යටතේ මේ දක්වා පශ්චාත් උපාධි පාඨමාලා සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීම සඳහා පිළිවෙළින් අවස්ථා 225 ක් සහ 17 ක් ලබා දී ඇති අතර, එහි 4වන කාර්යරාමුව යටතේ වන 3වන කණ්ඩායම සඳහා ජපන් යෙන් මිලියන 304ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 578ක) වටිනාකමින් යුත් ප්‍රදානයක් ලබා දීමට ජපාන රජය විසින් එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එම ප්‍රදානය ලබා ගැනීම වෙනුවෙන් ජපාන රජය සමඟ අදාළ හුවමාරු ලිපි අත්සන් තැබීමටත්, ඒ සම්බන්ධයෙන් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) සමඟ ගිවිසුමකට එළඹීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. ශ්‍රී ලංකා රජය සහ CHEC Port City Colombo (Pvt) Ltd. සමාගම අතර වන ත්‍රෛපාර්ශ්වික ගිවිසුම**

කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එවකට පැවති මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ CHEC Port City Colombo (Pvt) Ltd. අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමකට 2016 වර්ෂයේදී අත්සන් තබා ඇත. එකී ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඉලක්කගත අවසන් කිරීමේ දිනය 2025-06-05 වේ. කෙසේ වුව ද, පැවති කොවිඩ් - 19 වසංගතය සහ ව්‍යාපෘති සමාගමේ මූල්‍ය සීමාවන් හා ණය හිමියන් වෙත පවතින බැඳීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට නොහැකි වීම යන හේතූන් මත ව්‍යාපෘතිය නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වන බව

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவென்யூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

පෙනී ගොස් ඇති බැවින්, ව්‍යාපෘතිය අවසන් කිරීමේ කාලසීමාව වසර දෙකක (02) කාලයකින් දීර්ඝ කරන ලෙස ව්‍යාපෘති සමාගම විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම සැලකිල්ලට ගෙන කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව 2027-06-05 දින දක්වා දීර්ඝ කිරීමටත්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එකී ත්‍රෛපාර්ශ්වික ගිවිසුමේ වත්මන් පාර්ශ්වකරුවන් වන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ CHEC Port City Colombo (Pvt) Ltd. සමාගම අතර පරිපූරක ගිවිසුමකට අත්සන් තැබීමටත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **පොතුවිල් මූලික රෝහල මධ්‍යම රජයට පවරා ගැනීම සහ ශ්‍රී ලංකාවේ වෛද්‍ය සංචාරක ව්‍යාපාරය සඳහා විශේෂිත රෝහලක් ලෙස සංවර්ධනය කිරීම**

19 වන සියවසේ මුල් කාලයේ සිට සේවා සපයන පොතුවිල් මූලික රෝහල, ශ්‍රී ලංකාවේ පැරණිතම රෝහල්වලින් එකකි. ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් සඳහා පවතින වර්තමාන ඉල්ලුම සැලකිල්ලට ගනිමින් සංචාරකයින් සඳහා ගෙවන වාට්ටු පහසුකම්, රෝග නිවාරණ සත්කාර සේවා, වැඩිහිටි සත්කාර සේවා සහ සංචාරක ව්‍යාපාරය සඳහා ආයුර්වේද ප්‍රතිකාර පහසුකම් සහිතව එම රෝහල ඒකාබද්ධ සෞඛ්‍ය සේවා සපයන මූලික රෝහලක් බවට පරිවර්තනය කිරීමේ යෝග්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, දැනට නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන පොතුවිල් මූලික රෝහල, නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ එකඟත්වය මත සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීමටත්, වෛද්‍ය සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් ඇතුළත් කරමින් රටේ අග්නිදිග ප්‍රදේශයේ පවතින ඒකාබද්ධ සෞඛ්‍ය ආරක්ෂණ ආයතනය ලෙස එම රෝහල පවත්වාගෙන යාමටත් සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ගාල්ල ජාතික රෝහල ස්ථාපිත කිරීම**

කරාපිටිය ශික්ෂණ රෝහල, දකුණු පළාතෙහි සහ යාබද පළාත්වල රෝගීන්හට මාතෘ සත්කාර සේවා හැර තෘතීයික සේවා සපයන ප්‍රධානතම සෞඛ්‍ය මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක වන අතර, එකී පළාත්වල

ප්‍රාථමික හා ද්විතියික සෞඛ්‍ය සත්කාරක සේවා ආයතන මඟින් විශේෂඥ සේවාවන් සඳහා මෙම රෝහල වෙත රෝගීන් යොමු කිරීම සිදු කරනු ලබයි. රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඉගැන්වීමේ කටයුතු සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය ස්ථාපිත කර ඇත. ඒ අනුව, රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධි අපේක්ෂකයන් 1,100 දෙනෙකුට පමණ, ගාල්ල හෙද පුහුණු පාසලේ හෙද සිසුන් 500 දෙනෙකුට පමණ සහ ආසන්න වශයෙන් භෞත චිකිත්සකයන්, ඖෂධවේදීන්, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන් 100 දෙනෙකුට පමණ වාර්ෂිකව ඉගැන්වීමේ සහ පුහුණු කිරීමේ පහසුකම් සැපයීම මෙම රෝහල මඟින් සිදු වේ. මෙම වසර අවසන් වන විට රෝහලෙහි ඇඳන් ධාරිතාවය 2,858ක් දක්වා වැඩි කිරීම මත එය කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලට පමණක් දෙවැනි වන තෘතීයික සේවා සෞඛ්‍ය මධ්‍යස්ථානය බවට පත් වනු ඇත. ඒ අනුව, කොළඹ ජාතික රෝහලට සහ මහනුවර ජාතික රෝහලට අමතරව, කරාපිටිය ශික්ෂණ රෝහල ද ජාතික රෝහලක් ලෙස කාණ්ඩගත කරමින් ගාල්ල ජාතික රෝහල ලෙස නම් කිරීම පිණිස සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **ශ්‍රී ලංකාවේ නිල් ධජ වෙරළ තීරයන් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පාරිසරික අධ්‍යයන පදනමේ (Foundation of Environmental Education) අනුබද්ධ සාමාජිකත්වය ලබා ගැනීම**

ලෝකයේ විවිධ රටවල සංචාරක කර්මාන්තය සඳහා වැදගත් වන වෙරළ තීරයන්හි පරිසරය ආරක්ෂා කිරීම හා වෙරළ කලාපයට පැමිණෙන සංචාරකයන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම පිණිස විවිධ වැඩසටහන් හඳුන්වා දී ඇත. නිල් ධජ වෙරළ සහතික කිරීමේ වැඩසටහන (Blue Flag Beach Certification Programme) ඒ අතුරින් ප්‍රමුඛ වැඩසටහනක් වන අතර, සංචාරකයින් අතර ප්‍රචලිත පරිසර හිතකාමී සන්නාමයක් ද වේ. ජලයේ ගුණාත්මකභාවය, පරිසර කළමනාකරණය, පරිසර අධ්‍යාපන තොරතුරු සහ ජනතාවගේ ආරක්ෂාව යන ප්‍රධාන අංග හතර (04) යටතේ වන නිර්ණායක 32ක් සපුරාලීම මත අදාළ වෙරළ තීරය සඳහා මෙම වැඩසටහන යටතේ නිල් ධජ සහතිකය ලබා දෙනු ලැබේ. එම නිල් ධජ සහතිකය නිකුත් කරනු ලබන්නේ ඩෙන්මාර්කයේ පරිසර අධ්‍යයන පදනම (Foundation of Environmental Education) විසින් වන අතර, ශ්‍රී ලංකාව තුළ නිල් ධජ වෙරළ සහතික නිකුත් කිරීම සඳහා එකී ආයතනයේ අනුබද්ධ සාමාජිකත්වය ලබා ගත් ආයතනයක් මෙරට තුළ පැවතීම අවශ්‍ය වේ. ඒ අනුව, ඩෙන්මාර්කයේ පරිසර අධ්‍යයන පදනමේ අනුබද්ධිත සාමාජිකත්වය වසර දෙකක (02) කාලයක් සඳහා සමුද්‍රීය

පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත ලබා ගැනීමටත්, ඒ සඳහා පරිසර අධ්‍යයන පදනම සමඟ සහයෝගිතා ගිවිසුමකට එළඹීමටත් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. දීර්ඝකාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) යටතේ බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) ධාරිතාවන් ක්‍රියාත්මක කිරීම**

වසර 2030 වන විට මෙරට විදුලි අවශ්‍යතාවෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති සම්පත්වලින් සපුරා ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා 2024-2030 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති මගින් ජනනය කරනු ලබන පුනර්ජනනීය බලශක්ති ධාරිතාවන් ජාතික විදුලිබල පද්ධතියට එක් කර ගැනීම අත්‍යවශ්‍යව පවතී. රට තුළ පවතින සුළං සහ සූර්යබල විභවයන් සංවර්ධනය කිරීම සඳහා රජය විශේෂ අවධානයක් යොමු කර ඇති අතර, විචල්‍ය ස්වභාවයෙන් යුත් එම බලශක්තිය විදුලිබල පද්ධතියට එක් කිරීම ක්‍රමයෙන් වැඩි වන විට පද්ධතියේ විශ්වසනීයත්වය පවත්වාගෙන යාම සඳහා වඩාත් නම්‍යශීලී විදුලිබල පද්ධතියක් පැවතීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් වශයෙන් දීර්ඝකාලීන ජනන සැලැස්ම යටතේ බැටරි බලශක්ති ගබඩා පද්ධති හඳුනාගනු ලැබ ඇත. එම ක්‍රමවේදය 2024 සිට 2030 දක්වා කාලපරිච්ඡේදය තුළ යොදා ගැනීම පිළිබඳව අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පත් කරනු ලැබ ඇති කමිටුවේ නිර්දේශ මත පදනම්ව පුද්ගලික ආයෝජන හෝ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් යටතේ හෝ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා හඳුනාගනු ලබන බැටරි ධාරිතාවන් සංවර්ධනය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළේ සිට කොළඹ වරාය ග්‍රිඩ් උපපොළ දක්වා 2 වන 220kV භූගත කේබලය සැපයුම, බෙදාහැරීම සහ ඉදිකිරීම සඳහා වන ප්‍රසම්පාදනය**

කොළඹ මහනගර ප්‍රදේශයේ සිදු වන වරාය නගර සංවර්ධනය, වරාය පර්යන්තය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ මහා පරිමාණ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති සඳහා අත්‍යවශ්‍ය වාණිජමය බලශක්ති අවශ්‍යතාවන් වෙනුවෙන් විදුලිය සැපයීම සඳහා කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළේ සිට කොළඹ වරාය ග්‍රිඩ් උපපොළ දක්වා 2 වන භූගත කේබලය ස්ථාපනය කිරීම ඉතා අත්‍යවශ්‍ය වන බව හඳුනාගෙන තිබේ. ඒ අනුව, කෙරවලපිටිය

ග්‍රිඩ් උපපොළේ සිට කොළඹ වරාය ග්‍රිඩ් උපපොළ දක්වා 2 වන 220kV භූගත කේබලය සැපයුම, බෙදාහැරීම සහ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීම පිණිස 2021-09-13 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඉදිරිපත් කරනු ලැබ ඇති ලංසු ඇගයීමෙන් අනතුරුව සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරනු ලැබ ඇති Consortium of Jiangsu ETERN Co. Ltd, China & LS Cable & System Limited (LS Cable), Korea වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. බේරා ගැනීම, පුනරුත්ථාපනය සහ බුන්වත්භාවය පිළිබඳ පනත් කෙටුම්පත**

බුන්වත්භාවය පිළිබඳ ඒකාබද්ධ නීතියක් හඳුන්වා දීම සඳහා අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කර මූලික කෙටුම්පතක් සකස් කිරීම පිණිස 2023-06-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී නීති කොමිෂන් සභාව වෙත අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ලෝක බැංකුවේ තාක්ෂණික විශේෂඥ දැනුම ලබා ගනිමින්, උනන්දුවක් දක්වන රජයේ සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර, බේරා ගැනීම, පුනරුත්ථාපනය සහ බුන්වත්භාවය පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා පාදක කර ගැනීම පිණිස මූලික කෙටුම්පතක් නීති කොමිෂන් සභාව විසින් සකස් කරනු ලැබ තිබේ. එකී මූලික කෙටුම්පත මත පදනම්ව අදාළ කාර්යය සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. විදේශීය නඩු තීන්දු අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් නව නීතියක් හඳුන්වා දීම**

විදේශීය නඩු තීන්දු අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් නව නීතියක් හඳුන්වා දීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා සහ 1921 අංක 14 දරන නඩු තීන්දු අන්‍යෝන්‍ය වශයෙන් බලාත්මක කිරීමේ ආඥාපනත අවලංගු කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීමට 2022-07-18 දින පැවති අමාත්‍ය

මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, විවාහයක් විසුරුවා හැරීම හෝ අවලංගු කිරීම හෝ විවාහයේ පාර්ශ්වයන් වෙන් වීම සඳහා ප්‍රදානය කරන ලද විදේශීය නඩු තීන්දුවක් පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා වන විධිවිධාන ද ඇතුළත් කරමින් විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ තිබේ. එකී පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. ඒ අනුව, එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ස්ථායිකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ අදියර IIට අදාළව ස්ථාන 28ක සිවිල් වැඩ අධීක්ෂණය සහ කොන්ත්‍රාත් පරිපාලන උපදේශක සේවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

ස්ථායිකරණ ක්‍රමවේද මඟින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංරචක 05 කින් යුතු ව්‍යාපෘතියකි. එහි පළමු සංරචකය යටතේ නාය යාමේ අවදානමට ලක් වූ ස්ථාන 127ක් ව්‍යුහාත්මකව ස්ථාවර කිරීම සිදු කරනු ලබන අතර, එහි පළමු අදියර යටතේ වැඩබිම් 24ක වැඩ අවසන් කර ඇත. එහි දෙවන අදියර යටතේ කළුතර, රත්නපුර සහ මාතර දිස්ත්‍රික්කවලට අයත් ස්ථාන 32ක නාය යාම් අවම කිරීමේ සිවිල් වැඩ කොන්ත්‍රාත්තු දැනටමත් ප්‍රදානය කර තිබේ. ඉතිරි ස්ථාන 71න් මහනුවර, කුරුණෑගල, කෑගල්ල සහ මාතලේ දිස්ත්‍රික්කවලට අයත් ස්ථාන 28ක (පැකේජ අංක 5 යටතේ) නාය යෑම් අවම කිරීමේ සිවිල් වැඩ, කොන්ත්‍රාත්තු 5ක් මඟින් සිදු කිරීමට කටයුතු කර තිබේ. එකී පැකේජ අංක 5හි සිවිල් වැඩ අධීක්ෂණයට සහ කොන්ත්‍රාත් පරිපාලනය සඳහා උපදේශකයෙකු තෝරා ගැනීමට ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවා ඇත. ඒ අනුව ඉදිරිපත් වී ඇති සියලු යෝජනා ඇගයීමෙන් අනතුරුව, පැකේජ අංක 5 සඳහා උපදේශක සේවාව සැපයීමේ කොන්ත්‍රාත්තුව Resources Development Consultants (Pvt.) Ltd., Sri Lanka වෙත ප්‍රදානය කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතියක් (RASED) ස්ථාපිත කිරීම**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වුවද, එහි ආදායම් පරිපාලන කාර්යයන් සඳහා උපකාර කර ගැනීමට දෙපාර්තමේන්තුව තුළ දැනට පවතින පැරණි පද්ධතීන් අකාර්යක්ෂම වීම, ඉන් සිදුවන ආදායම් කාන්දු වීමට හා අක්‍රමිකතා වැනි දුර්වලතා ඇති වීමට හේතු වී ඇති අතර, මහජනතාවට හා අදාළ වෙනත් පාර්ශ්වයන්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ද අපහසු වී ඇත. එසේම, අනෙකුත් ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධතීන් සමඟ ඒකාබද්ධ වී කටයුතු කිරීමේදී ගැටලුකාරී තත්ත්වයන් මතු වී තිබේ. ඒ අනුව, සියලුම දත්ත හුවමාරුව, අවදානම් කළමනාකරණය හා ආදායම් සැසඳුම් යන මූලික කාර්යයන් ඉටු කර ගැනීම සඳහා වඩාත් කාර්යක්ෂම හා සඵලදායී තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතියක් හඳුන්වා දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. 1916 අංක 33 දරන තුවක්කු ආඥාපනත (182 අධිකාරය වූ) සහ 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත මඟින් නියම කර ඇති බලපත්‍ර ගාස්තු යාවත්කාලීන කර සංශෝධනය කිරීම**

1916 අංක 33 දරන තුවක්කු ආඥාපනතේ හා 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනතේ ප්‍රතිපාදන අනුව ආරක්ෂක අමාත්‍යාංශය විසින් කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බලපත්‍ර මත ගිනි අවි නිකුත් කිරීම සිදු කරනු ලබන අතර, ඒ සඳහා වාර්ෂික බද්දක් අය කරනු ලබයි. මේ වනවිට ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ගිනි අවි ප්‍රමාණය 34,318ක් වන අතර, බලපත්‍ර ගාස්තු වශයෙන් රුපියල් මිලියන 45ක පමණ මුදලක් වාර්ෂිකව මහා භාණ්ඩාගාරය වෙත බැර කරනු ලැබේ. කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි 1916 අංක 33 දරන තුවක්කු ආඥාපනත හා 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත සම්පූර්ණයෙන්ම සංශෝධනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් අවශ්‍ය පියවර ගෙන ඇති නමුත් එකී සංශෝධන සිදු කරනු ලබන තෙක්, අදාළ බලපත්‍ර ගාස්තු වත්මන් අවශ්‍යතා අනුව සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව කටයුතු කිරීමට හැකි වන පරිදි තුවක්කු ආඥාපනතේ 24 වගන්තිය හා 34 වගන්තියේ (1) උපවගන්තිය

කඩිනමින් සංශෝධනය කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

13. **බිංගිරිය ප්‍රදේශය සඳහා වන ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම**

බිංගිරිය අපනයන සැකසුම් කලාපය කර්මාන්ත හා ආයෝජන කලාප, පොදු පහසුකම්, ප්‍රවේශ මාර්ග, අභ්‍යන්තර මාර්ග සහ අදාළ අනෙකුත් යටිතල පහසුකම්වලින් සමන්විත අංග සම්පූර්ණ අපනයන සැකසුම් කලාපයක් ලෙස මේ වන විට සංවර්ධනය කෙරෙමින් පවතී. එහි I අදියර යටතේ ඉඩම් අක්කර 157ක් ද, II අදියර යටතේ ඉඩම් අක්කර 282ක් ද සංවර්ධනය කරනු ලබන අතර III අදියර යටතේ අමතර අක්කර 666ක් සංවර්ධනය කිරීමට හඳුනාගනු ලැබ ඇත. මෙම අපනයන සැකසුම් කලාපයේ ආර්ථික ප්‍රතිලාභ උපරිම ලෙස අත්කර ගැනීම සඳහා එම ව්‍යාපෘතියට සමගාමීව ඉරණවිල සහ හලාවත ප්‍රදේශ සංචාරක කේන්ද්‍රස්ථානයන් ලෙස සංවර්ධනය කිරීමටත්, හලාවත ගොල්ෆ් පිටියක් ඉදි කිරීමටත්, බිංගිරිය අපනයන සැකසුම් කලාපය ඉරණවිල සංචාරක කලාපය සමඟ සම්බන්ධ කරමින් මාර්ගයක් ඉදි කිරීමටත් සැලසුම් කර තිබේ. ඒ අනුව, බිංගිරිය ප්‍රදේශය සඳහා ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමටත්, එම සැලැස්ම යටතේ සියලු සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම දැනටමත් පත් කරනු ලැබ ඇති කාර්යසාධක බලකාය වෙත පැවරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **2018 අංක 2 දරන ප්‍රත්‍යන්ත විරෝධී සහ ප්‍රතිතෝල්ලන බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත සංශෝධනය කිරීම**

2024-05-13 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අනුමැතිය ලබා දී තිබේ. එකී පනත් කෙටුම්පත සකස් කිරීමේදී 2018 අංක 2 දරන ප්‍රත්‍යන්ත විරෝධී සහ ප්‍රතිතෝල්ලන බදු පනතට සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනතට ආනුෂාංගික සංශෝධන සිදු කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, 2018 අංක 2 දරන ප්‍රත්‍යන්ත විරෝධී සහ ප්‍රතිතෝල්ලන බදු පනත සහ 2018 අංක 3 දරන ආරක්ෂණ පියවර පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 15. වතු කම්කරුවන් සඳහා වැටුප් ගෙවීම

වතු කම්කරුවන් සඳහා දෛනික වැටුප් වැඩි කිරීමක් මෑතදී රජය විසින් ප්‍රකාශයට පත් කළද, ඇතැම් වතු සමාගම් විසින් එම වැඩි කරන ලද වැටුප ගෙවිය නොහැකි බවට රජය වෙත නියෝජනයන් ඉදිරිපත් කර ඇත. එම තත්ත්වය සැලකිල්ලට ගෙන පහත සඳහන් පියවරයන් ගැනීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

(i) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් වර්තමාන ජීවන වියදම සහ මෑතදී ඇති වූ ආර්ථික අර්බුදයේ බලපෑම් සැලකිල්ලට ගනිමින් වතු කම්කරුවකු වෙත ගෙවිය යුතු අවම වැටුප ඇස්තමේන්තු කිරීම.

(ii) එලෙස ඇස්තමේන්තුගත කරන ලද වැටුප ගෙවීම සම්බන්ධයෙන් එක් එක් වතු සමාගම සතුව පවතින හැකියාව පරීක්ෂා කර බැලීම පිණිස කමිටුවක් පත් කිරීම.

(iii) එමෙන්ම, කිසියම් වතු සමාගමක් අයහපත් කළමනාකරණය හේතුවෙන් වැටුප් ගෙවීමට අපොහොසත් වන්නේ නම්, එවැනි වතු සමාගම් සමඟ එළඹ ඇති ඉඩම් බදු ගිවිසුම් අවලංගු කිරීමට හැකි වන පරිදි නීති හඳුන්වා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

*************